දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

බෞසංසා 2.1 - බෞද්ධ සංස්කෘතියේ ව්‍යාප්තිය
BCG 2.1 - The Expansion of Buddhist Culture

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

01. ටිබ්බතීය ලාමා භික්ෂූන්ගේ ආගමික හා සමාජ කාර්යභාරය අගය කරන්න.

02. මධ්‍යම ජාවාහි පිහිටි බොරෝබුදූර් ස්ථූප හා විහාර සංකීර්ණයේ ක්‍රමික සැලැස්ම හා එහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

03. චීන තුර්කිස්ථානයේ බෞද්ධ පුරාවිද්‍යා ගවේෂණ ආරම්භ වූ ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

04. වියට්නාමයේ සිදුවූ මහා මානව සංහාරය සඳහා විදේශීය මැදිහත්වීම හා එහි ආගමික මෙන්ම සංස්කෘතික පරිහානිය පිළිබඳ සාකච්ඡා කරන්න.

05. ධර්මාශෝක යුගයේ භාරතීය බෞද්ධ ධර්මදූතයන්ගේ සේවාව අගයන්න.

06. බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත වූ භූගෝලීය කලාප දක්වා බෞද්ධ සංකල්ප කවර කාර්යයක් ඉටු කෙළේ ද යන්න පැහැදිලි කරන්න.

07. චීන බුදුසමයේ ව්‍යාප්තිය හා ස්ථාවරවීම කවර සංස්කෘතික පසුබිමක් පදනම් කරගත්තේදැයි විමසන්න.

08. බෝධිධර්ම ආචාර්යවරයාගේ චරිතය, චින්තනය හා පෞරුෂත්වය සංක්ෂිප්තව දක්වන්න.

09. පහත සඳහන් මාතෘකා දෙකකට (02) කෙටි සටහන් සපයන්න.
    i. ඛෝටානයේ (Khotan) බුද්ධදහම
    ii. ටිබ්බතයේ අතිශ පඬිවරයා
    iii. සුමාත්‍රාවේ බෞද්ධ සංස්කෘතික තොරතුරු
    iv. තායිලන්තයේ (සියමය) ආගමික හා ජාතික සිරිත් විරිත්
    v. චීන සහ ජපන් බෞද්ධ ආරාම
    vi. සෙන් බුද්දහම (Zen Buddhism)
    vii. සේද මාවත (Silk Route)
    viii. තාඕ හා කන්ෆියුසියස් වාද

***********************************